ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක ඉන්දීය ප්‍රදානයක්</u>

ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක ඉන්දීය ප්‍රදානයක් යටතේ මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සහ එම අංශයට වෛද්‍ය උපකරණ සැපයීම සඳහා වන අවබෝධතා ගිවිසුමකට ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ සෞඛ්‍ය සහ ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා විසින් 2025 සැප්තැම්බර් 09 වන දින අත්සන් තබන ලදී. සෞඛ්‍ය සහ ජන මාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ද මෙම අවස්ථාවට එක් විය.

2. මෙම ව්‍යාපෘතිය යටතේ මහල් දෙකකින් සමන්විත හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකයක් ඉදි කිරීමට සහ එම ඒකකය සඳහා අවශ්‍ය සියලුම වෛද්‍ය උපකරණ සැපයීමට අදහස් කෙරේ. මේ හරහා හදිසි අවස්ථාවන්හිදී කඩිනම් ප්‍රතිකාර ලබා දීම මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත සුරැකීමට ඉවහල් වෙමින් මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ වැදගත් අවශ්‍යතාවයක් සපුරාලනු ඇත. එසේම මෙම ව්‍යාපෘතිය සාමාන්‍ය දෛනික අභ්‍යන්තර රෝගීන් සංඛ්‍යාව සහ පවතින ඇඳන් සංඛ්‍යාව අතර පරතරය අවම කරමින් රෝහලේ වෛද්‍ය පහසුකම් ද ශක්තිමත් කරනු ඇත.

3. මයෙ ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන ඉහළ බලපෑමක් සහිත සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන් රැස අතරින් එකකි. දිවයින පුරා ක්‍රියාත්මක ‘1990’ සුවසැරිය ගිලන්රථ සේවාව; කොවිඩ්-19 වසංගත සමය තුළ ලබා දුන් වෛද්‍ය සහයෝගය; දික්ඔය ඉදිකරන ලද ඇඳන් 150කින් සමන්විත බහු විශේෂිත රෝහල; යාපනය ශික්ෂණ රෝහල සහ කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික් රෝහල් නවීකරණය කරමින් සහයෝගය ලබා දීම සහ මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා නව ශල්‍ය ඒකකයක් ඉදිකිරීම යනාදිය ඉන්දියාව විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද වැදගත් ව්‍යාපෘතීන් කිහිපයකි. ‘1990’ සුව සැරිය ගිලන්රථ සේවය ව්‍යාප්ත කිරීම සහ මුලතිව් දිස්ත්‍රික් මහ රෝහල සඳහා සිවු මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ඉන්දීය ප්‍රදාන ලබා දීමට ද අවධානය යොමු වී ඇත.

***

***කොළඹ***

*2025 සැප්තැම්බර් 09*